**නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් - 2016**

---

නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ්හි (ද කම්පැනි) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (මණ්ඩලය) වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**21. මතය**

---

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සමාගමේ බදු පෙර ශුද්ධ ලාභය රු.88,976,022 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.517,449,033 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.428,473,011 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම රු.59,643,830 කින් අඩුවීම හා කාර්ය මණ්ඩල පිරිවැය, ප්‍රචාරණ වියදම් හා පොලී වියදම රු.275,340,606 කින් ඉහල යාම මෙම පිරිහීමට ප්‍රධාන හේතු වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුල බදු පෙර ශුද්ධ ලාභය අඩුවී තිබුණද, කාර්ය මණ්ඩල පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් ක්ෂය කිරීම්වලට පසුව ආයතනයේ අගය එකතු කිරීම පෙර වර්ෂයේ රු.1,059,019,611 ක් වූ අතර මෙම වර්ෂයේ එම අගය රු.790,921,768 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ ආයතන හා සිසුන්ගේ විකාශනය වන අවශ්‍යතා සපුරාලීම සඳහා ලෝක මට්ටමේ අධ්‍යාපනය, පුහුණුව, සංවර්ධනය හා පර්යේෂණ සහ නවෝත්පාදන ඇති කරන අධ්‍යාපනික නිෂ්පාදන හා සේවා හා සේවා බෙදා හරින ක්‍රම ලබා දීම සමාගමේ අරමුණ වේ. කෙසේ වුවද, සමාගම විසින් ප්‍රධාන කාර්යසාධන දර්ශක (කේපීඅයි) මත වාර්ෂික ඉලක්ක සකස් කර නොතිබුණි.එම නිසා විගණනයේදී සත්‍ය කාර්යසාධනය අපේක්ෂා කළ ඉලක්ක සමඟ සැසඳීමට නොහැකි විය.
ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාගමේ ප්‍රධාන ක්ෂේත්‍රවල ප්‍රගතිය පහත දැක්වේ.

| ක්ෂේත්‍ර | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| පාඨමාලාවලින් ලද ආදායම | 381,848,973 | 582,371,274 | 782,648,252 | 1,138,195,911 | 1,078,552,000 |
| ප්‍රචාරණය සඳහා දරන ලද වියදම | 972,805 | 6,204,841 | 5,186,354 | 7,961,906 | 60,970,240 |
| බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | 2,212 | 2,364 | 1,979 | 2,080 | 2,617 |

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

සිසුන් 30,000 කට පමණ පහසුකම් ලබාදිය හැකි රු.බිලියන 8.6 ක් දරා ඉදිකරන ලද ගොඩනැගිල්ල 2016 ඔක්තෝබර් 16 දින ප්‍රසිද්ධියේ විවෘත කර තිබුණි. කෙසේ වුවද, විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉගෙනීම ලබන මුළු සිසුන් සංඛ්‍යාව 7,168 ක් පමණි. එනිසා සමාගමේ ගොඩනැගිලි පහසුකම්වලින් වැඩි ප්‍රමාණයක් දීර්ඝ කාලයක් තුල නිෂ්ක්‍රීයව පැවතුණි.

මේ සම්බන්ධයෙන් සමාගමේ උපකුලපති ප්‍රකාශ කරනු ලැබුවේ "සිසුන් 30,000 කට ප්‍රමාණවත් ගොඩනැගිල්ල ඉදිකිරීමේ මූලික සැලැස්ම අනුව වර්ෂ 10 ක කාලයකදී එනම් 2025 වර්ෂය අවසාන වන විට ඉලක්ක ලඟාකර ගැනීම බවය. පුරෝකථනය කරන ලද සංඛ්‍යා අනුව එන්එස්බීඑම් ආයතනය 2021 වර්ෂය තුල සිසුන් 20,000 ක සංඛ්‍යාවක් කරා යාමට අරමුණු කර ඇති බවය".

## 4.3 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සමාගමේ තත්‍ය කාර්ය මණ්ඩලය 54 ක්ව පැවතුණද, අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් හා සේවක සැලැස්මක් සමාගම සතුව නොපැවතුණි.

(ආ) 2016 අගෝස්තු 18 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව 2016 අගෝස්තු මස සිට අධ්‍යයන හා අධ්‍යයන නොවන කාර්ය මණ්ඩල වැටුප් සියයට 50 කින් වැඩි කර තිබුණි. කෙසේ වුවද, 2003 ජුනි 02 දිනැති අංක පීඊඑෆ්/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 පරිච්ඡේදය අනුව මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ පිළිබඳ වැඩිදුරටත් අනාවරණය වූයේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල සීමා ඉක්මවා සමහර නිලධාරීන් සඳහා වැටුප් වර්ධක ලබා දී ඇති බවයි.

## 5 පද්ධති හා පාලනයන්

විගණන කාර්යයන් තුල පහත සඳහන් පද්ධති හා පාලන දුර්වලතා නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතුව ඇත.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | පරිගණක පද්ධතිය තුල වර්ෂය සඳහා ආදායම හා ලැබීම් වෙනමම හඳුනාගැනීම සඳහා පහසුකම් නොමැතිවීම. මේ නිසා ගැලපීම් සටහන් අතින් කල යුතු වේ. |
| (ආ) | මුදල් කළමණාකරණය | මුදල් ලැබීම්, තැන්පත් කිරීම්, වාර්තා තබා ගැනීම හා සැසඳීම් කටයුතු සඳහා වෙන්කරන ලද රාජකාරී සහිත යෝග්‍ය ක්‍රමානුකූල ක්‍රමයක් දක්නට නොලැබුණි. |
| (ඇ) | තොග පාලනය | (i) 2016 දෙසැම්බර් 31 දිනට පරිගණකගත තොග ශේෂ හා භෞතික ලෙස තහවුරු කරන ලද තොග ශේෂ අතර වෙනස්කම් දක්නට ලැබුණි. පද්ධතිය යෝග්‍ය ලෙස යාවත්කාලීන කර නොතිබුණු බව වැඩි දුරටත් නිරීක්ෂණය විය.<br>(ii) සමාගමේ මූල්‍ය අත්පොත පරිදි තොග ලේඛනය නඩත්තු කර නොතිබුණි. |